පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු ලබන 20 වනදා ට පෙර නිකුත්කිරීමට හැකිවනු ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි.

මේ වනවිට එම කටයුතු අවසන් අදියරට පැමිණ ඇති බව පාසල් කටයුතු අතිරේක ලේකම් ලලිතා එගොඩවෙල මහත්මිය සඳහන් කළේය.

අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කළේ, විභාග ප්‍රතිඵලවලට අනුව ජනප්‍රිය පාසල් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ කඩඉම් ලකුණු නිකුත්කිරීම සිදුකරන බවය.

මෙවර පහ ශ්‍රේණිය ශිෂ්‍යත්වය ජනවාරි මස 22 වනදා පැවැත්වුණු අතර ප්‍රතිඵල මාර්තු මස 13 වනදා නිකුත් කළේය.

ශිෂ්‍යත්ව විභාගය සඳහා අපේක්ෂකයින් 340,508 දෙනෙකු පෙනීසිටි අතර විභාග මධ්‍යස්ථාන 2,943කදී සහ විශේෂ මධ්‍යස්ථාන 108කදී මෙවර විභාගය පැවැත්වුණි.